ESSAYS IN ARCHAEOLOGY :



# අනුරාධපුර යුගයේ පැවති අධ්‍යාපන සම්ප්‍රදායය පිළිබඳව සෙල්ලිපි මගින් අනාවරණය වන තොරතුරු පිළිබඳ විමසීමක්

**ආර්. එච්. අයි. එස්. රණසිංහ**

*හැඳින්වීම*

අනුරාධපුර යුගයෙහි ඉතා දියුණු අධ්‍යාපන සම්ප්‍රදායයක් වූ බව ඓතිහාසික මූලාශ්‍ර මගින් හෙළිවේ. එවකට වූ අධ්‍යාපනය පිළිබඳව ග්‍රන්ථ මූලාශ්‍රවල සඳහන් තොරතුරු තහවුරු කිරීම, ඒ පිළිබඳ නිවැරදි හා පුළුල් තොරතුරු දීම සහ ඒවායින් අනාවරණය නොවූ නව තොරතුරු දීම ආදියෙන් සෙල්ලිපිවලින් ලැබෙනුයේ අගනා පිටුවහලකි.

*බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය*

මෙරට බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේදී බුදුසසුන මුල් බැස ගැනීමත් සමග සිදුවිය. බුදුසසුන මෙරට ප්‍රතිෂ්ඨාපනයවීම සඳහා මෙරට උපන් මව්පිය දෙපලකට දාව මෙරට දී උපත ලැබූ අයෙක්, මෙරට දී මහණ වී, මෙරට දී ම විනය ඉගෙන, මෙරට දී විනය ඉගැන්විය යුතු බව දේවානම්පියතිස්ස රජුට මිහිඳු මාහිමියන් දන්වා ඇත. ඒ අනුව ඒ සඳහා සුදුසු වූ රජුගේ බෑනණුවන් වූ මහා අරිට්ඨ හිමි ථූපාරාමයේ දී විනය උගන්වා ඇත (විනයවිවෘති නම් වූ සිංහල සමන්තපාසාදිකාව, 1975 80-81).

මෙලෙස බෞද්ධ අධ්‍යාපනය ආරම්භ වීමට හේතු වූ මහින්දාගමනය පිළිබඳ පුවත සෙල්ලිපි මගින් සනාථ වේ. ක්‍රිස්තු පූර්ව හෝ ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසට අයත් යැයි සැලකෙන මිහින්තලයෙන් සොයා ගත් සෙල්ලිපියක් මහින්ද



තෙරුන් සහ භද්‍රසාල තෙරුන් පිළිබඳව සඳහන් වේ. එහි සඳහන් වනුයේ මෙරටට පළමුවෙන් ම පැමිණි මිහිඳු මාහිමියන් ප්‍රධාන පිරිසයි (Muller, no. 20, 1994, 30). මෙලෙස ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනය දිවයින පුරා ම ව්‍යාප්ත වූ බව ක්‍රිස්තු වර්ෂ දෙවන සියවස පමණ වනවිට දිවයින මුළුල්ලේ ම මෙන් බ්‍රාහ්මී සෙල්ලිපි පැතිර තිබීම අනුව සැලකිය හැකිය. එම යුගයෙහි සිටි ජනතාවගෙන් විශාල පිරිසකට යමක් ලිවීමෙහි මෙන් ම කියවා තේරුම් ගැනීමෙහි අවබෝධයක් වූ බව එම සෙල්ලිපිවලින් තහවුරු වේ.

ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ දී ස්වදේශික සම්ප්‍රදායයක් ලෙස ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනය මුල් යුගයේ පටන් ම භික්ෂූන් වහන්සේලා විසින් විධිමත් ව පවත්වා ගෙන එන ලදී. බුදුදහම හඳුන්වා දුන් යුගයේ පටන් ම ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස දක්වා සියවස් දෙකක් පමණ කාලයක් ථෙරවාදී බුදුදහමේ මධ්‍යස්ථානය මෙන් ම බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මහාවිහාරයයි. එසේ වුව ද, ක්‍රිස්තු පූර්ව පළමු වන සියවසේ වූ අභයගිරියේ ආරම්භයත්, ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවසේ වූ ජේතවනයේ ආරම්භයත් සමග බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රධාන මධ්‍යස්ථානයන් බවට මහාවිහාරය පමණක් නොව අභයගිරිය හා ජේතවනය ද පත්විය. ඒ අනුව මෙරට අධ්‍යාපනය මහාවිහාර, අභයගිරි සහ ජේතවන යනුවෙන් සම්ප්‍රදායයන් තුනක් යටතේ වර්ධනය විය.

*මහාවිහාර අධ්‍යාපන මධ්‍යස්ථාන*

මෙම සම්ප්‍රදායයන්ට අයත් අධ්‍යාපන මධ්‍යස්ථාන රාශියක් දිවයින පුරා තිබුණි. මහාවිහාරයට සම්බන්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන ගණනාවක් තිබූ අතර ඒවා දිවයින පුරා ම ව්‍යාප්තව තිබූ බවට සාධක ලැබේ. මුල් යුගයේ මහාවිහාරයේ පඤ්ච මහා ආවාස වශයෙන් ථූපාරාමය, මිරිසවැටිය, ඉස්සරසමණාරාමය, වෙස්සගිරි විහාරය සහ චේතියගිරි විහාරය සලකනු ලැබිය (විමලකීර්ති හිමි, 1954, 48). මෙම පඤ්ච මහා ආවාස පිළිබඳව ජේතවනාරාම භූමියෙන් හමු වූ

"... පච මහ අවස ..." යනුවෙන් සඳහන් සෙල්ලිපිකඩින් සනාථ වේ (EZ, Vol. IV, 1943, 282).

### *අභයගිරි අධ්‍යාපන මධ්‍යස්ථාන*

මහාවිහාරය පඤ්ච මහා ආවාසවලින් සමන්විත වූවා සේ, අභයගිරිය ප්‍රධාන ගුරුකුල හෝ අධ්‍යාපන ආයතන වශයෙන් සැලකිය හැකි කපාරාමූල, වහදූමූල, උතුරුමූල සහ මහනෙත්පාමූල යන මූලායතන හතරකින් යුතුව වර්ධනය වී ඇත. අනුරාධපුර යුගයේ අවසාන භාගය වනවිට අභයගිරියට අදාළ එම ආයතන වෙනුවෙන් විහාර කතිකාවත් ගණනාවක් පැනවීමට සිදු වී ඇත. එම වකවානුවෙහි අභයගිරියට සම්බන්ධ විහාර හා මූලයන් සතු ඉඩකඩම්, ධනෝපායන මාර්ග ආදිය බහුලවීම නිසා, භික්ෂු ජීවිතය සංකීර්ණවීම හේතුවෙන් විහාර පාලනය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් යෙදීම අවශ්‍ය විය. මිහින්තලේ පුවරු ලිපි (EZ. Vol. I, 1912, 84-90), ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපිය (EZ. Vol. I, 1912, 6-9), V කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය (EZ, Vol. I, 1912, 43-46), ආදියෙහි ඒ ඒ මූලායතනයට හෝ ආයතනයන්ට අදාළ වන පරිදි සම්මත කර ගන්නා ලද නීති මාලාවන් අන්තර්ගත වී ඇත. එම ලිපි මගින් එම ආරාමයන්හි අභ්‍යන්තර හා බාහිර පාලනය පමණක් නොව පැවිදි කිරීම සහ භික්ෂු අධ්‍යාපනය සම්බන්ධ අගනා තොරතුරු ද ලැබේ. මේවා වඩාත් වැදගත් වනුයේ මහාවිහාරවාසීන්ගේ වංසකථාවලින් අභයගිරි හා ජේතවන අධ්‍යාපනය පිළිබඳ ලැබෙන තොරතුරු අල්ප හෙයිනි.

II දාඨෝපතිස්ස (ක්‍රි.ව. 659-677) රජු අභයගිරියට පූජා කරන ලද කප්පූර පිරිවෙන (මහාවංසය, 43 පරි. 28 ගාථාව) ආශ්‍රිතව එහි ප්‍රථම මූලායතනය මෙන්ම ප්‍රධාන අධ්‍යාපන ආයතනය වශයෙන් සලකනු ලබන කපාරාමූලය බිහිවිය. V කාශ්‍යප (ක්‍රි.ව. 914-923) රජුගේ කාලය වනවිට කපාරාමූලය විශාල ආයතනයක් බවට පත්ව තිබූ බව එතුමාගේ අනුරාධපුර පුවරු ලිපියෙන් සනාථ වේ. කපාරාරාම සංස්කෘත ලිපියේ



අන්තර්ගත වූ කපාරාමූලයේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා ජල පහසුකම් සැපයීම (EZ, Vol. V, 1966, 168-169) පිළිබඳ කරුණුවලින් ද, සනාථ වනුයේ විශාල භික්ෂූන් සංඛ්‍යාවක් එහි සිටි බව සහ ක්‍රමවත් පාලනයක් එහි වූ බවයි.

මානවම්ම (ක්‍රි.ව. 684-718) රජු විසින් තනවන ලද වහදූමූලය (පූජාවලිය, 1959, 794) පිහිටියේ මහා කපාරාවට ආසන්නව අභයගිරිය සමීපයේය. V කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ "මහනෙත් පා වහඳු දෙඅවසටද් මෙ සිරිත් කරනු ඉසා" (EZ, Vol. I, 1912, 45) යනුවෙන් කපාරාමූලයට සහ සැගිරියට පැන වූ ව්‍යවස්ථා මහනෙත්පා සහ වහදූ යන ආයතන දෙකට ද යොදන ලෙස දක්වා තිබීමෙන් වහදූමූලය අභයගිරි ගුරුකුලයට සම්බන්ධ වූ බව සනාථ වේ. V අග්ගබෝධි (ක්‍රි.ව. 718-724) රජු විසින් තනවන ලද මහනෙත්පාමූල ද අභයගිරියට අයත් වූ මූලායතනයකි. ඉහත සඳහන් පරිදි කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියෙහි පැන වූ ව්‍යවස්ථා මාලාව මහනෙත්පාමූලටත් පොදු විය.

එක් එක් මූලයන්ට අයත් විහාරාරාමයන් ද තිබුණි. උදාමහයාගේ පුලියම්කුලම් ලිපියෙන් ලැබෙන කරුණු ද (EZ, Vol. I, 1912, 185-186) ඒ සඳහා සාධකයකි. කපාරාමූලයට අයත් පුවරම් වෙහෙරින් ආ භික්ෂූන් සහ ඔවුන්ට සිවුපසයෙන් උපස්ථානය කිරීම පිළිබඳව තොරතුරු එහි අන්තර්ගතය.

ආරම්භයේ දී මහාවිහාරයට අයත් වූ මිහින්තලේ පසු කාලයේ එනම් මහසෙන් සමයේ දී, අභයගිරිවාසීන් අත්කර ගත් හෙයින්, එය අභයගිරි ගුරුකුලයට අයත් ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්විය. ඒ බව IV මහින්ද (ක්‍රි.ව. 956-972) රජු මිහින්තලේ පිහිටුවන ලද පුවරු ලිපි මගින් සනාථ වේ. එම ලිපිවලින් එහි අභ්‍යන්තර හා බාහිර පාලනය ගැන නීති පනවා ඇති හෙයින්, එය විශාල ආයතනයක් ව තිබූ බව සැලකිය හැකිය. එසේ ම එහි සංවිධායක මණ්ඩලයට අභයගිරි භික්ෂූන් ද සම්බන්ධ විය යුතු යැයි ඇති සඳහනින් එය අභයගිරියට අයත් බව අනාවරණය වේ. මිහින්තලේ ඉඳිකටු සැයෙන් මහායාන සූත්‍ර අඩංගු තඹ තහඩු ලැබීම (EZ, Vol. III,

1933, 199-212), මහායාන දහමේ මූලධර්මයන් වන ධර්මකාය, සම්භෝගකාය, නිර්මාණකාය යන ත්‍රිකායන්ට කළ නමස්කාර ඇතුළත් ත්‍රිකායන්ථව සෙල්ලිපියක් මිහින්තලේ ආරාධනා ගලේ කොටා තිබීම (EZ, Vol. IV, 1943, 242-246), ආදී සාධක මගින් ද, එය මහායාන මධ්‍යස්ථානයක් ව පැවති බව සනාථ වේ.

### *ජේතවන අධ්‍යාපන මධ්‍යස්ථාන*

මහාවිහාර සහ අභයගිරි නිකායයන්ට පසුව ආරම්භ වූ ජේතවන නිකායට අධ්‍යාපනය සඳහා විශිෂ්ට මෙහෙයක් කරන ලද්දා වූ විහාරාරාම, පිරිවෙන් මෙන් ම, දකුණුමූලය හා සෙනෙවිරද්මූලය ද අයත් විය. අනුරාධපුරයෙන් හමු වූ සෙල්ලිපිකණ්ඩක (EZ, Vol. III, 1933, 227) III අග්ගබෝධි (ක්‍රි.ව. 633-643) රජුගේ අමාත්‍ය පොත්ථසාත තනවන ලද සේනාපතිරාජ පිරිවෙන මුල්කර ඇති වූ සෙනෙවිරද්මූලය පිළිබඳ තොරතුරු සඳහන් වේ. ජේතවන නිකායට අයත් විහාරාරාම සහ අධ්‍යාපන මධ්‍යස්ථාන රටෙහි වෙනත් ප්‍රදේශයන්හි ද තිබී ඇත. ලහාසිකා සහ හුණාලා ආදී අධ්‍යාපන මධ්‍යස්ථානයන් වශයෙන් පැවතුන විහාරයන් ද එයට අයත් වූ බව ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපියෙහි (EZ, Vol. I, 1912, 6-7) සඳහන් වේ.

මහාවිහාර, අභයගිරි ජේතවන යන ප්‍රධාන නිකාය සම්ප්‍රදායයන් තුනට අමතරව අනුරාධපුර යුගයේ පශ්චිම භාගයේ බිහි වූ නිකායක් ද තිබී ඇති බව චතුර් මහා නිකායේ භික්ෂූන්ට ආරාමයක් පවරා දුන් බවට ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපියේ ඇති සඳහනින් (EZ, Vol. I, 1912, 9) සැලකිය හැකිය. මෙම හතරවන නිකායේ ආරම්භය පිළිබඳ පුවත වංසත්ථප්ප-කාසිනියෙහි දැක්වේ. දාඨෝපතිස්ස රජ සමයෙහි ජේතවන නිකායට අයත් කොලොම්බහාලක පිරිවෙන්වාසී දාඨාවේධක සහ කුරුන්දමුල්ලක පිරිවෙන්වාසී දාඨාවේධක යන එකම නම ඇති භික්ෂූන් වහන්සේලා දෙනම විසින් විනයපිටකය සංස්කරණය කළ බව එහි සඳහන් වේ (වංසත්ථප්පකාසිනී, 1974, 123). එය පිළිගත් කණ්ඩායම ලෙස



හතරවන නිකාය සලකනු ලැබේ. මෙම නිකාය සම්ප්‍රදායට අයත් අධ්‍යාපන ආයතනයන් ද තිබූ බව සැලකිය හැකිය.

මෙතෙක් සාකච්ඡා කළ නිකායයන් විසින් පවත්වා ගෙන ගිය අධ්‍යාපන රටාව භික්ෂු අධ්‍යාපනය හා ගිහි අධ්‍යාපනය යනුවෙන් ක්‍රම දෙකකින් සමන්විත විය.

### *භික්ෂු අධ්‍යාපනය*

මෙම යුගයේ භික්ෂු අධ්‍යාපනය ඉතා උසස් තත්ත්වයක පැවතුණි. සෑම භික්ෂුවක් ම අනිවාර්යයෙන් ම අධ්‍යාපනය ලද යුතු විය. ඔවුනට සසුන්ගත වීමට පූර්ව අවශ්‍යතා වශයෙන් ද, සසුන්ගත වීමෙන් පසුව සාමණේර අවධියෙහි ද උපසම්පදාවෙන් පසුව ද, හැදෑරිය යුතු නිශ්චිත විෂයමාලාවන් සහ නිශ්චිත ග්‍රන්ථ සම්භාරයක් ද තිබුණි.

යමෙක් සසුන්ගත වීමට පෙර තිබිය යුතු අධ්‍යාපනය පිළිබඳව V කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියෙන් හෙළිවන තොරතුරු ඉතා ම වැදගත් ය. ඒ අනුව සසුන්ගත වීමට බලාපොරොත්තු වූ නවකයන් (ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයන්) ත්‍රිපිටකයේ සතර බණවර කොටස ගැන අවබෝධයක් තිබිය යුතු වූ බව "පිරිත් සතර බණ්වර් පිණිස වූවන් මහණ් කරණු ඉසා..." (EZ, Vol. I, 1912, 45) යන සඳහනින් පැහැදිලි වේ. සතර බණවර යනු සූත්‍රපිටකයට අයත් පස්මහා නිකායෙන් ගෙන සංග්‍රහ කරන ලද සූත්‍ර කොටසක් වන අතර පිරිත් පොත වශයෙන් ද හැඳින්වේ. මෙය අනුරාධපුර යුගයේ අවසාන භාගය පමණ වනවිට සෑම නිකායකට ම බලපැවැත් වූවක් බව සැලකිය හැකිය.

භික්ෂු අධ්‍යාපනයේ දී ත්‍රිපිටකය සහ අටුවා හැදෑරීම ප්‍රධාන විය. ඒ අතුරින් අභිධර්ම අධ්‍යයනයට විශේෂ ස්ථානයක් ලැබුණි. මිහින්තලේ පුවරු ලිපිවල එම විහාරයෙහි වසමින් විනයපිටකය හදාරණ භික්ෂූන් වහන්සේලාට වසග් (වස්ත්‍රයෙන් හා ආහාරයෙන් කොටස්) පහක් ද, සූත්‍රපිටකය හදාරණ භික්ෂූන් වහන්සේලාට වසග් සතක් ද, අභිධර්මපිටකය හදාරණ භික්ෂූන්

වහන්සේලාට වසග් දොළහක් ද දිය යුතුය යන සඳහනින් (EZ, Vol. I, 1912, 85) ඒ බව සනාථ වේ.

භික්ෂු අධ්‍යාපනයේ දී මහායාන ධර්මය අන්තර්ගත වෛතුල්‍යපිටකය හදාරා ඇති බවට ද සෙල්ලිපි මගින් සාධක ලැබේ. අභයගිරියට සැලකූ මහසෙන් රජු විසින් වෛතුල්‍ය-පිටකය ලියවා පඤ්ච මහා ආවාසයන්හි තැන්පත් කිරීම පිළිබඳව ජේතවනාරාම භූමියෙන් හමු වූ සෙල්ලිපිකඩෙහි සඳහන් වේ (EZ, Vol. IV, 1943, 282). ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසෙහි දඹදිව පැවැත් වූ හතරවන ධර්ම සංගායනාවෙන් පසු ප්‍රචලිත වූ සූත්‍ර නමයකින් සමන්විත වූ වෛතුල්‍යපිටකය අභයගිරි හා ජේතවන පාඨමාලාවන්ට අයත් වූ බවත්, මහසෙන් රජුට එය මහාවිහාර ආරාමයන්හි තැන්පත් කරවීමට හා එම අධ්‍යයන පාඨමාලාවන්ට ඇතුලත් කිරීමට අවශ්‍ය වූ බවත් මේ අනුව සැලකිය හැකිය.

ජේතවන නිකායට අයත් ආරාමයන්හි තුමවත් සැලැස්මකට අනුව අධ්‍යාපනය දුන් බව ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපියෙන් හෙළි වේ. එම ලිපියෙහි ජේතවන ආරාමයන්හි අධ්‍යාපන කටයුතු සඳහා පනවනු ලැබූ නීතිමාලාවන් අන්තර්ගත වේ. ඒ අනුව එක් නිකායකින් විසිපස් දෙනා බැගින් ඇතුළත් වන සේ, සිව්මහා නිකායෙන් තෝරා ගත් භික්ෂූන් සිය දෙනෙකුට එම ආරාමය පවරා ඇත. ඒ අතරින් ශාස්ත්‍ර අධ්‍යයනය කිරීමෙහි යෙදුණු භික්ෂූන් වහන්සේලා හතළිහකට ද එහි ඉඩ සලසා තිබූ අතර ඔවුනට කිසිදු නිකායකට අනුබද්ධ නොකර ඉගැන්විය යුතු යැයි නියම කර තිබුණි (EZ, Vol. I, 1912, 9). ඒ අනුව ජේතවන අධ්‍යයන පාඨමාලාවන්ට ජේතවන පමණක් නොව, අභයගිරි හා මහාවිහාර පාඨමාලාවන්හි ද සම්බන්ධයක් තිබූ බව අනාවරණය වේ.

භික්ෂු අධ්‍යාපනයේ දී ශබ්ද විද්‍යාවට ප්‍රධාන තැනක් දී ඇති බව සීගිරි ගී වලින් හෙළි වේ. ශබ්ද විද්‍යාව යටතේ උගන්වන ලද ඡන්දෝලංකාර පිළිබඳ දැනුම ලබා දක්ෂ ලෙස



කාව්‍ය රචනා කළ භික්ෂූන් සීගිරි ගී ලියූවන් අතර සිටියහ. තිස හිමියන් ගී (47), නාල් හිමියන් ගී (93), තලපා පිරිවෙන් වැසි සෙන් පැවිජ්ජන් ගී (270), රණහල පිරිවෙන් වැසි අනන්ද පැවිජ්ජන් ගී (310) ආදී වශයෙන් භික්ෂූන් විසි එක් දෙනෙකුගේ ගී ඇත.

## *ගිහි අධ්‍යාපනය*

අනුරාධපුර යුගයෙහි ගිහි අධ්‍යාපනය ද දියුණු තත්ත්වයක වූ බවට සෙල්ලිපි මගින් හෙළි වේ. කලින් දැක් වූ පරිදි දිවයින පුරා පැතිර තිබූ සෙල්ලිපි සංඛ්‍යාව පිරික්සන කල්හි සාක්ෂරතාවයකින් හෙබි ජනතාවක් දිවයින පුරා සිටි බව පැහැදිලිය. එම සෙල්ලිපි සිංහල පමණක් නොව, සංස්කෘත ද්‍රවිඩ ආදී භාෂාවලින් ද ලියා තිබීමෙන් සැලකිය හැක්කේ විවිධ භාෂාවන් පිළිබඳ ලත් අධ්‍යාපනයක් එවකට මෙරට වාසීන්ට තිබූ බවය.

සීගිරි බලකොටුව සහ කලා නිකේතනය නැරඹීමට දිවයිනේ විවිධ දෙසින් ගිය ජනතාව විසින් එහි කැටපත් පවුරෙහි නාමිකව හා නිර්නාමිකව ලියන ලද රචනයන්ගෙන් එම යුගයේ කවිත්වය, පාණ්ඩිත්වය හා සාහිත්‍ය ස්වරූපය මැනවින් හෙළිදරව් වේ. එම රචනා බොහෝමයක් ක්‍රිස්තු වර්ෂ අට, නවය, දහය යන සියවස්වලට අයත් බව සලකනු ලැබේ (මුදියන්සේ, සීගිරි ගී, 1963. XI). සීගිරිය නැරඹීමට ගිය පිරිස් අවට පරිසරයේ චමත්කාරය, කාන්තා රූප ඇතුළු සිත්තම්, සිංහරූප ආදියෙන් වශීව තමන්ට පහළ වූ සෞන්දර්යාත්මක හැඟීම් කුරුටු රචනා මගින් විවිධාකාරයෙන් පළ කර ඇත. සීගිරියේ කැටපත් පවුර පුරාණ ලංකාවේ ජනතාවගේ අධ්‍යාපන තත්ත්වය හා ප්‍රමාණය අප ඇස් ඉදිරියේ මවාපාන නිදසුනක් ලෙස රාහුල හිමියෝ සඳහන් කරති. (රාහුල හිමි, 1999, 312).

ගිහි අධ්‍යාපනයේ දී රජ කුමාරවරුන් හට විශේෂ අධ්‍යාපන ක්‍රමයක් තිබූ බව සෙල්ලිපි මගින් හෙළිවේ. බෞද්ධ

රාජධර්ම අනුව රජවරු සතර අගතියෙන් තොරව දසරාජ ධර්මයෙන් රට පාලනය කළ යුතු විය. IV මිහිඳු රජ ඒ අනුව රට පාලනය කළ බව වෙස්සගිරි පුවරු ලිපියෙන් (EZ, Vol. I, 1912, 31) සනාථ වේ. ඒ සඳහා අවශ්‍ය බෞද්ධ අධ්‍යාපනය භික්ෂූන් වහන්සේලා වෙතින් ඔවුන් ලත් බව නිසැකය. රජවරු අභිධර්මය හැදෑරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ බව V කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය අනුව සැලකිය හැකිය. කාශ්‍යප රජු අභිධර්මය හැදෑරීම පමණක් නොව ඒ සඳහා විශේෂ උගත්කමක් ද දක්වා ඇත. එතුමා අභිධර්මය පිළිබඳ කෘතීන් තම ගුරුවරයා ඉදිරියේ විස්තර කර පහදා දුන් බවත්, සිය බසින් බුදුගුණ වර්ණනා කළ බවත් එහි සඳහන් වේ (EZ, Vol. I, 1912, 43).

එවකට අධ්‍යාපනයෙහි පුරෝගාමීන් වූයේ භික්ෂූන් වහන්සේලාය. එසේ වුව ද, ගිහි අධ්‍යාපනය දුන් ගුරුවරුන් අතර ගිහියෝ ද වූහ. ඔවුහු විනය නීති අනුව භික්ෂූන් විසින් ඉගෙනීමෙන් හෝ ඉගැන්වීමෙන් වැළකිය යුතු වූ ආගමික නොවන විෂයයන් උගන්වන්නට ඇත. මිහින්තලේ පුවරු ලිපිවලින් ගිහි ගුරුවරුන් පිළිබඳ තොරතුරු ලැබේ. ඒ අනුව මිහින්තලේ චේතියගිරි විහාරයේ දීමනා ලබන්නන් අතරට ගිහි ගුරුවරුන් ද ඇතුළත් විය. සමහරු ගුරුවරුන් ද (ඇදුරු දමී), සමහරු දම් දෙසන්නන් ද (බණ්වච්ජාරන දමී) වූ අතර ඔවුන් හයදෙනෙකු වෙනුවෙන් ගුතෑගම නම් ගමෙහි ආදායම වෙන් කර තිබුණි (EZ, Vol. I, 1912, 89).

### නිගමනය

මේ අන්දමට අනුරාධපුර යුගයේ අධ්‍යාපන සම්ප්‍රදායය ආරම්භ වීම, මහාවිහාර, අභයගිරි සහ ජේතවන යන ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථාන, එම අධ්‍යාපන සම්ප්‍රදායයන් තුන යටතේ පැවති, භික්ෂු සහ ගිහි යනුවෙන් සංවිධානය වූ විධිමත් අධ්‍යාපන රටාව ආදිය පිළිබඳව සෙල්ලිපි මගින් අගනා තොරතුරු අනාවරණය වේ.



### ආශ්‍රිත ග්‍රන්ථ


මහාවංසය, 1996, අනු. ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ඛිත හිමි, ගොඩගේ, කොළඹ.

මුදියන්සේ, නන්දසේන, 1963, සීගිරි ශ්‍රී, ගුණසේන, කොළඹ.

Muller, Edward, 1984, *Ancient inscriptions in Ceylon*, Asian Educational Services, New Delhi.

Paranavitana, *S. 1943, Epigraphia Zeylanica*, Vol. IV, Oxford University Press, London.

Paranavitana & C. E. Godakumbura, *1966, Epigraphia Zeylanica*, Vol. V, Archaeological Department, Colombo.

පූජාවලිය, 1959, සංස්., කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ගුණසේන, කොළඹ.

රාහුල හිමි, වල්පොල, 1999, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, ගොඩගේ, කොළඹ.

වංසත්ථප්පකාසිනී : මහාවංස ටීකාව, 1994, අනු අකුරැස්සේ අමරවංශ හිමි සහ හේමචන්ද්‍ර දිසානායක, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය.

විනයවිවෘති නම් වූ සිංහල සමන්තපාසාදිකාව : පාරාජික කාණ්ඩය, 1975, අනු. අම්බලන්ගොඩ ධම්මකුසල හිමි, ස්වර්ණමාලි මංගලිකා ගුණතුංග, කොළඹ.

Wickramasinghe, D. M. De Z. 1912, *Epigraphia Zeylanica*, Vol. I, Oxford University Press, London.

Wickramasinghe, D. M. De Z. 1928, *Epigraphia Zeylanica*, Vol. II, Oxford University Press, London.

Wickramasinghe, D. M. De Z. 1933, *Epigraphia Zeylanica*, Vol. III, Oxford University Press, London.